පුරවැසි සංවාද
பிரஜைகள் உரையாடல்
Citizen's Dialogue
අංක | இல. | No.
04

# අරගලය: අඛණ්ඩ ගමනක

කෞශල්‍ය කුමාරසිංහ



LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

# අරගලය:
# අඛණ්ඩ ගමනක

කෞශල්‍ය කුමාරසිංහ

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

**අරගලය**: අඛණ්ඩ ගමනක

© නීතිය හා සමාජ භාරය, 2025

ISBN : 978-624-5545-33-9

මෙම පදීතයේ අන්තර්ගතය හෝ එහි කොටස් වාණිජ්‍යය නොවන පරමාර්ථයන් සඳහා පමණක් උපුටා ගැනීම හා පිටපත් කිරීමට ලේඛණය හා එහි ප්‍රකාශන නියමාකාරයෙන් හඳුන්වා දීමෙන් අනතුරුව සිදු කිරීමට අවසර ඇත.

**කෞශල්‍ය කුමාරසිංහ**

සිංහල පරිවර්තනය - අමරසේන එදිරිසිංහ

සෝදුපත් බැලීම - සකුණ ගමගේ

ප්‍රකාශනය :

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

දුරකතන : +94 11 2691228
+94 11 2684845
+94 11 2684853
ෆැක්ස් : +94 11 2686843
විද්‍යුත් තැපෑල : info@lstlanka.org
වෙබ්අඩවිය : www.lstlanka.org

# අරගලය: අඛණ්ඩ ගමනක*

කෞශල්‍ය කුමාරසිංහ

## හැඳින්වීම

අරගලය යනු ජූලි 9 වෙනි දින ගෝඨාභය රාජපක්ෂගේ ඉල්ලා අස්වීමත් සමග අවසන් වූ සිදුවීමක් ලෙස දේශපාලන සාමාන්‍ය බුද්ධිය තුළ පුළුල් ලෙස පිළිගනු ලැබේ. කෙසේ වෙතත්, අරගලය යනු මිනිසුන් ඉතිහාසයේ වේදිකාව අත්පත් කරගත්තා වූ අපූර්ව අවස්ථා වලින් ඔබ්බට පරිණාමය වන ක්‍රියාවලියක් ලෙස අවබෝධ කර ගැනීම 2022 වර්ෂයේ මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකාව අත්විඳිමින් සිටින සමාජ පරිවර්තනය පිළිබඳ වඩාත් සියුම් කියවීමක් සපයන්නේ යැයි මෙම පත්‍රිකාව යෝජනා කරයි. එසේ වුවත්, පාලක ප්‍රභූන් සහ පොදු ජනතාව අතර තිබූ සමාජ ගිවිසුම අවසන්වී තිබූ බව ප්‍රකාශ කිරීම සඳහා ජනතාව මිලියන ගණනින් වීදි බසින ලද සිදුවීමෙහි ඇති වැදගත් සහ කල් පවත්නා බලපෑම් මෙම පත්‍රිකාව විසින් නොසලකා හරින්නේ නැත.

* මෙම පත්‍රිකාව නීතිය හා සමාජ භාරය සඳහා සිදු කරන ලද පශ්චාත් අරගල යුගයේ සිදු වූ දේශපාලන පරිවර්තනය නැමති පර්යේෂණය සඳහා සිදු කළ ක්ෂේත්‍ර කටයුතු අර්ධ වශයෙන් උපයෝගී කර ගෙන සකස් කර ඇත. නීතිය හා සමාජ භාරයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සකුන්තලා කදිරගාමර්, නීතිය හා සමාජ භාරයේ වැඩසටහන් අධ්‍යක්ෂ සඳුන් තුඩුගල සහ නීතිය හා සමජ භාරයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක විදුර මුණසිංහ විසින් ලබා දෙන ලද සහයෝග යට මම බෙහෙවින් කෘතඥ වෙමි. දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේ දී පර්යේෂණ සහකාර ලෙස සේවය කළ දමිත් කොණ්ඩදෙණිය ලබා දුන් අමිල සහයෝගයට ද මම ස්තුතිවන්ත වෙමි.

නමුත් ඉන්පසු ව අරගලය එහි උපක්‍රම වෙනස් කරමින්, නව ක්‍රියාකාරීන් ඇතුළත් කරගනිමින් සහ වෙනස් තලයකට මාරු වෙමින් අඛණ්ඩව පරිණාමය වෙන බව මෙම පත්‍රිකාව තර්ක කරයි. මෙම අදියරේ දී, ආරම්භක අවධියේ තිබූ ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම වෙනුවට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී වතාවත් ස්ථාපනය විය. මෙම දෙවන අදියර ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය යන දෙකෙහි දී ම ජාතික ජන බලවේගය ජයග්‍රහණය කිරීමෙන් අවසන් විය. තවද, අරගලයේ පළමුවෙනි සහ දෙවෙනි අදියරවල දී ඇතිකර ගත් අපේක්ෂා සාක්ෂාත් කර ගැනීමට නම් නව සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම අත්හදා බලනු ලබන ඊළඟ අදියරක් මතුවිය යුතු යැයි මෙම පත්‍රිකාව අනුමාන කරයි.

මෙම පත්‍රිකාව විධිමත් පර්යේෂණ ක්‍රම හරහා රැස් කරගන්නා ලද දත්ත[1] මත මෙන්ම මෙහි සාකච්ඡා කරන ලද තත්වයන්ට සහභාගී වීම[2] වැනි අවිධිමත් ක්‍රම පදනම් කරගෙන සකස් කර ඇත. එයට අමතරව, මැතිවරණ ප්‍රතිඵල මගින් විධිමත් සහ අවිධිමත් ක්‍රම හරහා රැස් කරන ලද අනෙකුත් දත්ත වර්ග සමග සංවාදාත්මකව සහ තාර්කිකව සම්බන්ධ කළ හැකි සාරවත් දත්ත සපයා දෙයි.

අරගලයේ විවිධ අවධීන් පිළිබඳ විමසා බැලීමට පෙර, අරගලය විසින් පසුව ඇති කරන ලද පරිවර්තනයන්ට පෙළඹවීම ලබා දුන් දේශපාලන ක්‍රියාකාරිත්වයේ මෑත කාලීන දේශීය ඉතිහාසය කෙටියෙන් පරීක්ෂා කර බැලීම වැදගත් වේ. මෙම ඉතිහාසය ප්‍රධාන සංසිද්ධි දෙකකට ලඝු කළ හැකි ය; එම සිදුවීම් දෙක වැදගත් වන්නේ අනෙකුත් සිදුවීම් වැදගත් නොවන නිසා නොව, ඒවා පසුකාලීන වර්ධනයන් සඳහා වඩාත් ම ප්‍රබල පෙළඹවීම ලබා දුන් සිදුවීම් ලෙස පවතින බැවින් ය. ඉන් පළමුවැන්න 2015 වර්ෂයේ ජනාධිපතිවරණය වන

1. ඉහත සඳහන් කළ පර්යේෂණයේ කොටසක් ලෙස මම සේරුවිල, මාතලේ, සූරියවැව, කුරුණෑගල සහ මීගමුව යන ප්‍රදේශවල ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා පැවැත්වූ අතර, එම එක් එක් ස්ථානයේ සම්මුඛ සාකච්ඡා දහයක් පවත්වන ලදී.
2. මම අප්‍රේල් 9 වෙනි දින සිට අඛණ්ඩව දින 50 ට අධික කාලයක් කොළඹ ගාලුමුවදොර පැවති අරගලයට පෞද්ගලිකව ම සහභාගී වුනෙමි.

අතර, දෙවැන්න ජනතා විමුක්ති පෙරමුණ තුළ සිදු වූ අභ්‍යන්තර පරිවර්තනයයි. ගෝඨාභය රාජපක්ෂගේ ජයග්‍රහණය හෝ පසුව සිදු කළ තීරණ ගැනීම් අරගලයට පැහැදිලි අදාළත්වයක් තිබුණ ද මම මෙහි දී ඒ පිළිබඳව සාකච්ඡා නොකරමි.

2014 වර්ෂය වන විට, මෛත්‍රීපාල සිරිසේන 2015 ජනාධිපතිවරණයේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත්වීම සඳහා විපක්ෂයට යාමට පෙර, මහින්ද රාජපක්ෂ පාලනය පරාජය කළ නොහැකි පාලනයක් ලෙස පෙනෙන්නට තිබුණි. එබැවින්, මැතිවරණයේ දී පොදු අපේක්ෂකයාගේ ජයග්‍රහණය රාජපක්ෂ පාලනයේ නැවත පිලිසකර කල නොහැකි බිඳවැටීමක් සනිටුහන් කළේය. රාජපක්ෂ පාලනය විසින් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන හා ආර්ථික ආයතන මෙන්ම නීතියේ ආධිපත්‍යය ද අඩපණ කරමින් බලය රැස් කරමින් සිටි ආකාරය මගින්, 2015 වර්ෂයේ  පරාජය සිදු නොවූයේ නම් එම පාලනය සැබවින්ම ඒකාධිපති පාලනයක් බවට පරිණාමය විය හැකිව තිබූ බව පෙන්නුම් කරයි.

ගෝඨාභය රාජපක්ෂ වැනි චරිතයකට බලය ඒමට මග පාදන ආකාරයකට 2019 වර්ෂයේ දී සිරිසේන-වික්‍රමසිංහ පරිපාලනය ඛේදජනක ලෙස අවසන් වුවද, ඉතිහාසය ඇගයීමේ දී මෙම කාලය තුළ සිදු වූ ඇතැම් වෙනස්කම් නොසලකා හැරිය යුතු නොවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වෙනි සංශෝධනය අහෝසි කර 19 වෙනි සංශෝධනය හඳුන්වා දීම එවැනි එක් වැදගත් අවස්ථාවක් විය. 18 වෙනි සංශෝධනය මගින් ජනාධිපතිවරයෙකුට එම ධූරය දැරිය හැකි වාර ගණන පිළිබඳ සීමාව ඉවත් කිරීම ඇතුළුව විධායක ජනාධිපති ධූරයේ බලතල බොහෝ ආකාර වලින් වර්ධනය කර ගෙන තිබුණි. 19 වෙනි සංශෝධනය මගින් විධායක ජනාධිපති ධූරයේ බලතල යම් ප්‍රමාණයකට අඩු කරන ලද නමුත් ගෝඨාභය රාජපක්ෂ විසින් එම බලතල නැවත වරක් වැඩි කිරීම සඳහා 20 වන සංශෝධනය හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, 19 වෙනි සංශෝධනය මහින්ද රාජපක්ෂට

බාධාකාරී තත්වයක් නිර්මාණය කළ අතර, ඒ හේතුවෙන් ඔහුට 2019 ජනාධිපතිවරණයට තරග කිරීමෙන් වැළකී, කිසිදු දේශපාලන අත්දැකීමක් නොමැති ගෝඨාභය රාජපක්ෂ ඔවුන්ගේ අපේක්ෂකයා ලෙස නම් කිරීමට ඔහුගේ පක්ෂයට සිදු විය. ඉතිහාසය පෙන්වා දෙන පරිදි, ගෝඨාභය රජපක්ෂට අත්දැකීම් නොමැතිකම පැවති ගැටළු උග්‍ර කළේය.

වර්ෂ 2015 සහ 2019 අතර කාලය තුළ, කතා කිරීමේ නිදහසෙහි ගුණාත්මකභාවය ද සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. විශේෂයෙන් සමාජ මාධ්‍ය, නිදහස් සාකච්ඡා සඳහා වේදිකාවක් බවට පරිවර්තනය වූ අතර, එහි දී ජනතාව දේශපාලනඥයින් සහ ඔවුන්ගේ තීරණ පිළිබඳ ඔවුන්ගේ කලකිරීම් හාස්‍යජනක පිංතූර, වීඩියෝ හා මීම්ස් හරහා ප්‍රකාශ කළහ. ගෝඨාභය මුලදී දැඩි නායකයෙකු ලෙස පෙනී සිටියද, අවසානයේ දී ඔහුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව හිමි ධූර කාලය අවසන් වීමට පෙර අකාලයේ ඔහුගේ පාලනය අවසන් කිරීමට හේතු වූ අරගලයට උත්ප්‍රේරකයක් බවට පත් වූ, සමාජ මාධ්‍යවලට ලැබුණු සාපේක්ෂ නිදහස ඔහුට සම්පූර්ණයෙන් ම ආපසු හැරවීමට නොහැකි විය.

මේ අතර, පසුගිය කාලයේ බරපතල පසුබෑමකට මුහුණ දී සිටි ජනතා විමුක්ති පෙරමුණ අනුර කුමාර දිසානායකගේ නව නායකත්වය යටතේ පරිවර්තනය වීමට සූදානම් වෙමින් සිටියේ ය. රජයේ ප්‍රචණ්ඩ මර්දනයට තුඩු දුන් සන්නද්ධ අරගල දෙකක ඉතිහාසයක් ඇති, 1969 දී පිහිටුවන ලද, කාඩර්වරුන්ගෙන් සමන්විත වාමාංශික දේශපාලන පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණ ස්වකීය තත්ත්වය කුඩා විරුද්ධ පක්ෂයක මට්ටමේ සිට රට පාලනය කිරීමේ විභවයක් සහිත විශාල දේශපාලන බලවේගයක් දක්වා වර්ධනය කර ගැනීම අත්‍යන්ත සීමාකම් රැසකට මුහුණ දී තිබින. ජනතා විමුක්ති පෙරමුණ දූෂිත නොවූ පක්ෂයක් යැයි පුළුල් ලෙස සලකනු ලැබුවද, එයට සැලකිය යුතු ඡන්දදායක සහයෝගයක් ලැබුණේ එය සාම්ප්‍රදායික ප්‍රභූ දේශපාලන පක්ෂ සමග පෙළ ගැසුණු විට ය.

එම නිසා පුළුල් ආකර්ෂණයක අවශ්‍යතාවය සපුරාලීම සඳහා සහ එතෙක් ළඟා වී නොතිබූ සමාජ පන්තිවල සහයෝගය ලබා ගැනීම සඳහා ජනතා විමුක්ති පෙරමුණු නායකත්වය විසින් ජාතික විද්වත් සංවිධානය පිහිටුවා ගත්තේ ය. මෙම වේදිකාව ප්‍රධාන දේශපාලන පක්ෂ විවේචනය කළ විශ්ව විද්‍යාල ශාස්ත්‍රඥයින්ට සහ වෘත්තිකයන්ට ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය සමඟ සම්බන්ධ වීමට මාර්ගයක් සපයා දුන්නේය. ජනතා විමුක්ති පෙරමුණ ජාතික විද්වත් සංවිධානයේ පෙරමුණ ගත්තද, එය ස්වාධීන සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වෙමින් බොහෝ බුද්ධිමතුන් සහ වෘත්තිකයන් ආකර්ෂණය කර ගත්තේය. මෙය පක්ෂයේ පරිවර්තනයෙහි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය.

ජනාධිපතිවරණ සමයේ දී මෛත්‍රීපාල සිරිසේනට සහාය දුන් සහ පසුව 2015 මහ මැතිවරණයේ දී ජනතා විමුක්ති පෙරමුණට සහාය පළකළ ජනප්‍රිය කලාකරුවන් සහ ක්‍රියාකාරීන්ගෙන් සමන්විත සිවිල් සමාජ සංවිධානයක් වන 'අළුත් පරපුර' සංවිධානයේ සහභාගීත්වය මෙම පරිවර්තනයේ පූර්ව ඇඟවීමක් විය. මෙම කාල පරිච්ඡේදය තුළ, ජනතා විමුක්ති පෙරමුණ ස්වකීය සාම්ප්‍රදායික දෘෂ්ටිවාදයට සම්පූර්ණයෙන් ම අනුකූල නොවන කණ්ඩායම් සහ පුද්ගලයින් සමග පවා සංධානගත වීමට කැමැත්තක් පෙන්නුම් කළේය. උදාහරණයක් ලෙස, LGBTQ+ ප්‍රජාව සමග සංවාදයක් ආරම්භ කිරීම එම පක්ෂයේ දෘෂ්ටිවාදයෙහි ව්‍යාප්තිය පෙන්නුම් කළේය. සිවිල් සමාජ කණ්ඩායම්, බුද්ධිමතුන් සහ වෘත්තිකයන් සඳහා වූ මෙම විවෘතභාවය අවසානයේ දී 2019 වර්ෂයේ මැතිවරණයට තරග කළ ජාතික ජන බලවේගය බිහිවීමට මග පෑදුවේ ය.

මෙම කාලය තුළ, ජනතා විමුක්ති පෙරමුණ ස්වකීය වාගලංකාරය වාමාංශික හා ජාතිකවාදී රාමුවක සිට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සහ විශ්වව්‍යාපී රාමුවකට මාරු කළේය. සාම්ප්‍රදායිකව මෙම පක්ෂය ග්‍රාමීය, පහල මධ්‍යම සමාජ පන්තිවල සහයෝගය මත විශ්වාසය

තබා තිබුණද, දැන් එය නාගරික මධ්‍යම පන්තිය ද ආකරෂණය කර ගැනීමට පටන් ගෙන තිබිණ. මෙම පරිවර්තනයවීම් සමග එම පක්ෂය ජනප්‍රිය ප්‍රගතිශීලී බලවේගයක් ලෙස ඉස්මතුවීම සිදුවුවත්, 2019 මැතිවරණවලදී ජාතික ජන බලවේගය ලබා ගත්තේ ඡන්දවලින් 3% ක් පමණි. ප්‍රභූ දේශපාලනයට සහයෝගය දෙන ශක්තිමත් අනුග්‍රාහක ජාල සහ පාස්කු ඉරුදින ප්‍රහාරවලින් පසු ගෝඨාභයගේ ජනප්‍රියත්වය විසින් ජාතික ජන බලවේගයේ නැගීම වළක්වන ලදී.

කෙසේ වෙතත්, ජාතික ජන බලවේගය ජනතාව ඒකරාශි කර ගැනීම අඛණ්ඩව සිදු කරගෙන ගිය අතර, විශේෂයෙන් ම ගෝඨාභයගේ තීරණ ගැනීම මගින් විවිධ සමාජ කණ්ඩායම් ඈත් කිරීම එයට පිටුවහලක් විය. සාම්ප්‍රදායික දේශපාලන පක්ෂයක් හෝ සන්ධානයක් ලෙස ක්‍රියා කරනවා වෙනුවට ජාතික ජන බලවේගය ජනතා ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත වූ අතර, විශේෂයෙන් ම ගෝඨාභය ඉවත්වීමෙන් පසුව රනිල් වික්‍රමසිංහ ජනාධිපති ධුරයට පත් කිරීමෙන් පසු අරගලය අස්ථාවර තත්වයකට පත් වූ කාලය තුළ මෙය පුළුල්ව සිදු විය.

ඉහත විස්තර කළ සංසිද්ධි දෙක 2022 මාර්තු මාසයේ දී අරගලය විසින් ආරම්භ කරන ලද විශාල සමාජ පරිවර්තනයට අවශ්‍ය පෙළඹවීම ලබා දුන්නේ යැයි මම යෝජනා කරමි. මෙහි ඉදිරි කොටස් වලදී, පුරවැසියන් අතර දේශපාලන විඥානයේ වර්ධනය සහ දේශපාලනිකව සම්බන්ධවීමේ ක්‍රමවල පරිවර්තනය නිරූපණය කරන අරගලයෙහි අදියර තුන කෙරෙහි දැන් මම අවධානය යොමු කරමි.

## පළමු වෙනි අදියර:
## ප්‍රතිරෝධයේ සිට ක්‍රම වෙනසක් පරිකල්පනය කිරීම දක්වා

බොහෝ ශ්‍රී ලාංකිකයන්ට දක්නට ලැබුණු පරිදි, ඉන්ධන පෝලිම්, ගෑස් හිගය, අත්‍යාවශ්‍ය භාණ්ඩ නොමැතිකම සහ විදුලි කප්පාදුව හරහා ආර්ථික අර්බුදය සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිතයට පැහැදිලිවම බලපෑම් එල්ල කළ විට, 2022 මාර්තු මාසයේ දී අරගලය ආරම්භ විය.

ආරම්භයේ දී, තමන්ගේ මූලික අවශ්‍යතා සපයා දෙන ලෙස රජයෙන් ඉල්ලා සිටින පුවරු රැගෙන ජනතාව පොදු ස්ථානවල සිටින බව පැවසෙන පෝස්ට්ස් විවිධ පුද්ගලයින් සමාජ මාධ්‍යවල පළ කරනු දක්නට ලැබිණ. එම පළකිරීම්වලට සිය ගණන් ජනයාගේ සහයෝගය ලැබුණු අතර, නිරන්තර විරෝධතා සංවිධානය කරන නව කණ්ඩායම් ගොඩනැගීමට ද ඒවා හේතු විය.

ජනාධිපතිවරයාගේ නිවස අසල විරෝධතාවයක් පැවැත්වෙන තෙක් ම, බොහෝ දෙනෙක් කිසිදා දේශපාලනිකව ක්‍රියාකාරී නොවූ පුද්ගලයන් වන මධ්‍යම පාන්තික පුරවැසියන් විසින් පවත්වන ලද මෙම හානිකර නොවන බවක් පෙනෙන්නට තිබූ විරෝධතා බොහෝ දුරට නොසලකා හරින ලදී. කෙසේ වෙතත්, ජනාධිපතිවරයාගේ නිවස අසල පැවති විරෝධතාව හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළ අතර, මෙම කුඩා, සාමකාමී වූ විරෝධය දැක්වීම් ජනාධිපතිවරයාට සහ රජයට එරෙහි පුළුල්, ප්‍රකෝපයෙන් ඇවිස්සුණු, වඩාත් විශාල සහයෝගීතා ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීමේ සලකුණු පෙන්නුම් කළේය. කලින් පැවති විරෝධතා මෙන් නොව, මෙය හුදෙක් මූලික අවශ්‍යතා ඉල්ලා සිටීමක් ම වූයේ නැත. දේශපාලන සවිඥානිකභාවයේ ගුණාත්මක වෙනසක් සනිටුහන් කරමින්, රජයට ඉවත්ව යන ලෙස ඒවායින් පැහැදිලිව ම ඉල්ලා සිටියේය.

එබැවින්, මෙම මොහොත දේශපාලන සවිඥානිකභාවයේ ගුණාත්මක පරිවර්තනයක් සනිටුහන් කළේය. පරිවර්තනය වූ දේශපාලන සවිඥානිකභාවය විසින් පවතින තත්ත්වය තවදුරටත් යථා තත්ත්වයට පත් කිරීමක් ඉල්ලා සිටියේ නැත; එයට වඩා වැඩි යමක් එයට අවශ්‍ය විය. කෙසේ වෙතත්, එතැන් සිට ඉල්ලීම අසම්පූර්ණ විය. රජය ඉවත්ව යන ලෙස රජයෙන් ඉල්ලා සිටීම ස්ථිර විසඳුමක් අපේක්ෂා නොකළ හුදු ප්‍රතිරෝධය දැක්වීමේ ක්‍රියාවක් විය. උදාහරණයක් ලෙස, රජය ඉවත් වූ පසු බලය භාරගන්නේ කවුරුන්ද යන ප්‍රශ්නයට පිළිතුරක් නොතිබුණි. එබැවින්, මෙම විරෝධතාවය හුදු ප්‍රතිරෝධය දැක්වීමේ

සවිඥානිකභාවය විසින් මෙහෙයවන මධ්‍යස්ථ විරෝධතාකරුවන් 'ප්‍රකෝපිත ජනකායක්' බවට පරිවර්තනය වීමේ විභවය සංඥා කළේය.

පළමු වරට, මෙම විරෝධතා ව්‍යාපාරය තුළ ඇතැම් කඩාකප්පල්කාරී උපක්‍රම භාවිතා කරන ලදී. සමාජ ව්‍යාපාර පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී, කඩාකප්පල්කාරී උපක්‍රම වැඩි සාර්ථකත්වයකට මග පාදන්නේද, නැතහොත්, අනෙක් අතට මර්දනයට ආරාධනා කරන්නේද යන්න ප්‍රධාන ප්‍රශ්න වලින් එකක් වේ (ගුයිග්නි, 1999). ගැම්සන් (1990) සඳහන් කරන පරිදි, කඩාකප්පල්කාරී උපක්‍රම බොහෝ විට මධ්‍යස්ථ ක්‍රමවලට වඩා සාර්ථකත්වයට පත් වෙයි. ශ්‍රී ලාංකාවේ විරෝධතා වලදී මෙය පැහැදිලිව පෙනී ගියේය: ඔවුන් මධ්‍යස්ථ ක්‍රමවලින් තරමක් ගැටුම්කාරී උපක්‍රම වෙත මාරු වූ විට රජයට ඒවා බැරෑරුම් ලෙස සැලකීමට සිදුවිය.

රජය ඇඳිරි නීතිය පැනවූ විට ජනතාව එයට අවනත නොවී කඩාකප්පල්කාරී උපක්‍රම අඛණ්ඩව සිදු කළ අතර, එය රාජ්‍යය සහ එහි පුරවැසියන් අතර ඇති සමාජ ගිවිසුම සැලකිය යුතු මට්ටමකින් උල්ලංඝනයක් කිරීමක් විය. ගුයිග්නි (1999) සඳහන් කරන පරිදි, " පාලන තන්ත්‍රයන් අවදානම් සහගත තත්ත්වයන්හි තිබෙන විට හෝ අභියෝගවලට විවෘත වී ඇති විට කඩාකප්පල් කිරීම් සාර්ථක වීමට ඉඩ ඇති නමුත් එසේ නොමැති විට සිදුකරන කඩාකප්පල්කාරී ක්‍රියා මර්දනයට ආරාධනා කරයි." මහජන ප්‍රතිචාර වලින් පසු අමාත්‍ය මණ්ඩලය ඉල්ලා අස්වීම පාලන තන්ත්‍රය රැඳී සිටින අවදානම්සහගත තත්වය පෙන්නුම් කළ නමුත් විරෝධතා සන්සුන් කිරීමට එතරම් දෙයක් කළේ නැත.

ඒ වෙනුවට, ජනතාව අතර පුළුල් ලෙස පැතිර යන සමාජ මාධ්‍ය සටහනක් "ගෝඨා ගෝ හෝම්" (Gota Go Home) යන සටන් පාඨය සමගින් ජනාධිපතිවරයා ඉල්ලා අස්විය යුතු යැයි ඉල්ලා සිටිමින් අප්‍රේල් 9 වෙනි දින කොළඹ ගාලු මුවදොර පිටියට මිලියනයක ජනතාවක් එක්රැස් වන ලෙස ඉල්ලා සිටියේ ය. ඒ අනුව, අප්‍රේල් 9

වෙනි දින පෙර නොවූ විරූ ජනකායක් ගාලු මුවදෙරට එක් විය. එම විරෝධතාකරුවෝ ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉදිරිපස ගේට්ටුව සහ ගාලු මුවදොර පිටියේ කොටසක් අල්ලා ගත්හ. විවිධ ප්‍රදේශවල විසිරී තිබූ විරෝධතා මෙදින තනි, තිරසාර අවකාශයකට ඒකාබද්ධ කළ බැවින් මෙම දිනය ව්‍යාපාරයේ පරිණාමයෙහි වැදගත් අවස්ථාවක් සනිටුහන් කළේය. කුමාරසිංහ (2023) සඳහන් කරන පරිදි:

*මේ අවකාශය තුළ ප්‍රකාශනයේ විෂමජාතීත්වය ඉතාමත් පැහැදිලි වූ අතර, එය දේශපාලන සංවිධාන විසින් සංවිධානය කරන ලද අතීත විරෝධතාවලදී ප්‍රදර්ශනය කළ පුවරුවල තිබූ ඒකාකාරී බවට හාත්පසින්ම වෙනස් විය. බෙර, ගිටාර් සහ සැක්සෆෝන් වාදන සමගින් "ගෝඨා ගෝ හෝම්" යනුවෙන් ගායනා කළ, පාට කරන ලද මුහුණු සහ ශරීර ඇති පුද්ගල කණ්ඩායම් සිටියහ. විරෝධතාවයේ ශබ්ද පසුබිම අතීත පෙළපාලිවල ශබ්ද පසුබිම සිහිපත් කළේ නැත. රැස්ව සිටි පිරිසට අණ කිරීමට කේන්ද්‍රයක් හෝ පැහැදිලි නායකත්වයක් නොතිබුණි. එසේ වුවද, අපද්‍රව්‍ය සුදුසු පරිදි බඳුන්වලට එකතු කරන ලද අතර, අවශ්‍ය විට ජලය ද බෙදා දෙන ලදී. සවස් වරුවේ දී, සිය ගණනක් මුස්ලිම්වරු සාමූහිකව යාඥා සමග උපවාසය අවසන් කළ අතර, ඔවුන් අසලින් ක්‍රිස්තියානි පූජකවරු  ගමන් කළහ. සෑම තැනකම දකින්නට තිබූ ජාතික කොඩියෙහි සිංහල බෞද්ධ ජාතිකවාදී ඇඟවීම් නොතිබූ බවක් පෙනෙන්නට තිබුණි. මෙම ජන සමූහය විවිධත්වය සැමරූ නිසා, ජනතාව නව ප්‍රකාශන ක්‍රම සහ විරෝධය දැක්වීමේ ක්‍රම සොයා ගැනීමට පසුබට නොවූහ.*

අත්පත් කරගත් භූමිය තුළ කඩාකප්පල් කිරීමේ සහ මධ්‍යස්ථභාවයේ උපක්‍රම අතර මනා සමබරතාවය හොඳින් දක්නට ලැබුණි. සෑම කඩාකප්පල්කාරී උපක්‍රමයක්ම අවිහිංසාවාදීව සිදු කරන ලද අතර, එය විරෝධතා ව්‍යාපාරයේ සුජාතභාවය ශක්තිමත් කළේය. විරෝධතාකරුවෝ ක්‍රමයෙන් ප්‍රජා මුළුතැන්ගෙයක්, වැසිකිළි සහ

කැසිකිළි, වෛද්‍ය මධ්‍යස්ථානයක් සහ මාධ්‍ය මධ්‍යස්ථානයක් වැනි තාවකාලික පහසුකම් ස්ථාපනය කළහ. ඔවුන් පුරවැසි රැස්වීම් ශාලාවක්, පුස්තකාලයක්, සිනමා ශාලාවක්, එළිමහන් රඟහලක්, කලාගාරයක්, විවෘත මයික්‍රෆෝන අවකාශයන්, මහජන විශ්වවිද්‍යාලයක් සහ ළමා ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයක් ද ඉදි කළහ.

ව්‍යාපාරය ජනතාවගේ එදිනෙදා ජීවිතයේ කොටසක් බවට පත් වූ පසු, එම අත්පත් කරගත් භූමිය අඩු ජනගහනයක් සහිත අවකාශයක් බවට පත් විය. කෙසේ වෙතත්, සංස්කෘතික අංග සහ සාකච්ඡා සමගින් දවසේ පැය 24 පුරා ම සටන් පාඨ ප්‍රකාශ කිරීම අඛණ්ඩව සිදු වූ අතර, එම අවකාශය සජීවී හා ජවසම්පන්න විය. ප්‍රධාන සටන් පාඨය වන 'ගෝඨා ගෝ හෝම් යන්න නොවෙනස්ව පැවති අතර, දූෂණයෙන් තොර රටක්, ක්‍රම වෙනසක්, ජාතිවාදයෙන් තොර සමාජයක් යනාදිය ඉල්ලා සිටින වෙනත් සටන් පාඨ ද තිබුණි. එබැවින්, 'ගෝඨා' යන වචනයට ජනාධිපතිවරයාගේ නමෙන් ඔබ්බට ගිය බොහෝ අර්ථ එක් විය. විරෝධතා දැක්වීමේ ක්‍රමයෙහි මෙම මාරුවීම එම කාලය තුළ දේශපාලන විඥානය ක්‍රමයෙන් පරිවර්තනය වූ ආකාරය පිළිබඳ සලකුණක් ලෙස දැකිය හැකිය. එය හුදෙක් ජනාධිපතිවරයාට සහ රජයට ඉල්ලා අස්වන ලෙස ඉල්ලා සිටීමක් පමණක් නොවීය; එය නව ක්‍රමයක් තුළ ක්‍රියාත්මක වන නව රටක් පිළිබඳ පරිකල්පනයක් බවට පත්විය. කෙසේ වෙතත්, මෙම පරිකල්පනය නොපැහැදිලි එකක් වූ අතර, එය ක්‍රියාවට නැංවීම සඳහා වූ දේශපාලන වැඩසටහනක් ඉදිරිපත් කිරීමට සැලකිය යුතු ප්‍රයත්නයක් නොතිබුණි.

ව්‍යාපාරය තුළ විවිධ දේශපාලන ස්ථාවරයන් තිබූ නිසා, ඉදිරිය පිළිබඳ එකඟතාවයකට පැමිණීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 'ක්‍රම වෙනස' යනු දේශපාලන දෘෂ්ටිවාදයක් තුල වෙනස් අනන්‍යතා එකට සුසම්බන්ධ කරන බරපතල හෙජමොනික මැදිහත්වීමකින් පමණක් පිරවිය හැකි හිස් හැඟවුම්කාරකයක් ලෙස පැවතුණි.

කෙසේ වෙතත්, ගාලු මුවදොර පිටිය අත්පත් කර ගැනීම, මිනිසුන් තථ්‍ය කාලීනව ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ඉගෙන ගෙන ක්‍රියාත්මක කළ ප්‍රජාතන්ත්‍රවාදයේ සෘජු ජීවමාන අත්හදා බැලීමක් බවට පත් විය. සම්පත් කළමනාකරණය කිරීම, සාමය පවත්වාගෙන යාම සහ සාමූහික තීරණ ගැනීම සඳහා විරෝධතාකරුවන් ඔවුන් විසින් ම කමිටු ලෙස සංවිධානය විය. විරෝධතා භූමිය ආර්ථික ප්‍රතිපත්ති, යහපාලනය සහ මානව හිමිකම් වැනි කරුණු පිළිබඳව පුරවැසියන් දැනුවත් කරන ප්‍රසිද්ධ සාකච්ඡා, දේශන මෙන්ම සංස්කෘතික සංදර්ශන සඳහා ඉඩ සලසා දුන්නේ ය. දේශපාලන සවිඥානිකභාවය හැඩගැස්වීමේදී සහ ශක්තිමත් කිරීමේදී සමාජ මාධ්‍ය භාවිතය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. ෆේස්බුක්, ට්විටර් (X) සහ ටික්ටොක් වැනි වේදිකා තොරතුරු බෙදා ගැනීම, සහයෝගය ඒකරාශි කර ගැනීම සහ තථ්‍ය කාලීනව සිදුවීම් ලේඛනගත කිරීම සඳහා වූ අවකාශයන් බවට පත්විය. සමාජ මාධ්‍යවල පළවූ වීඩියෝ හා ඡායාරූප රාජ්‍ය ප්‍රචාරණයට අභියෝග කිරීමට සහ පාලක පන්තියේ අසාර්ථකත්වය පිළිබඳව විශාල පිරිසකට හෙළි කිරීමට උපකාරී විය. මෙම සහභාගීත්ව ක්‍රියාවලිය විසින් දේශපාලන සවිඥානිකභාවය පුළුල් කළේ යැයිද, ප්‍රජාතන්ත්‍රවාදය යනු කලින් කලට ඡන්දය දැමීමට පමණක් සීමාවූ දෙයක් නොව, එය ක්‍රියාකාරී සහ සහභාගීත්ව ක්‍රමයක් ලෙස දැකීමට මිනිසුන්ට උපකාරී වූයේ යැයිද යමෙකුට සිතිය හැකි ය.

අත්පත් කරගත් භූමියට නොපැමිණ සිටි පුරවැසියන් ද ව්‍යාපාරයේ ජීව ගුණයට සම්බන්ධව සිටියේ කෙසේ දැයි මැයි 9 වන දින දක්වා ජනතාව තේරුම් ගෙන සිටියේ නැත. රජයේ සහචරයින් ගෝඨාගෝගමට පහර දුන් විට, රට පුරා දක්වන ලද ප්‍රතිචාරය ක්ෂණික විය. මැරයින්ට පහර දීමට අවට ප්‍රදේශවලින් මිනිසුන් එක්රැස් වූවා පමණක් නොව, එම මැරයන්ගේ ගම්වල මිනිසුන් එම මැරයන් ආපසු පැමිණෙන තෙක් බලා සිටියහ. රජයේ දේශපාලනඥයන්ගේ නිවාස සහ පෞද්ගලික කාර්යාල බොහොමයකට පහර දී පුළුස්සා දමන ලදී. මෙම කෝපාවිෂ්ඨ ප්‍රතිචාර දැක්වීම් රට පුරා පුළුල්ව පැතිර තිබුණ ද,

එම ක්‍රියාවන්ට සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව පැහැදිලිව දැකගත නොහැකි විය. එබැවින්, එම ප්‍රබල ප්‍රතිචාරයේ කාර්යක්ෂමතාවයට අභිරහස් ස්වභාවයක් තිබූ අතර, එමගින් එම ප්‍රහාර පිටුපස තිබූ බලවේගය වන්නේ ජනතා විමුක්ති පෙරමුණ බවට කුමන්ත්‍රණ න්‍යායන් ගොඩනැගීමට රජයට ඉඩ සැලසුණි.

ජූලි 9 වෙනි දින මිලියන ගණනක් ජනතාව ජනාධිපති මන්දිරයට කඩා වැදුණු විට සහයෝගීතාවයේ ප්‍රමාණාත්මක ස්වභාවය ප්‍රකාශ විය.

ජනාධිපතිවරයා සහ රජය බලයෙන් පහ කිරීමත් සමග අරගලයේ පළමු අදියර අවසන් විය. වික්‍රමසිංහ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස බලයට පත් වූ විට, සමාජයේ සුළු කොටසක් ඔහුට සහාය දුන් නමුත් බහුතරයක් ඉන් කලකිරීමට පත් වූහ. අප විසින් කරන ලද සම්මුඛ සාකච්ඡා වලදී හමුවන අරගලය පිළිබඳ ආඛ්‍යාන එහි ධනාත්මක බලපෑම් පිළිබඳව සඳහන් කරන අතර ම, අවසානයේ එය සාර්ථක නොවූ බව බොහෝ දෙනෙක් විශ්වාස කරන බවක් ද දක්නට ලැබින. කෙසේ වෙතත්, ප්‍රතිරෝධය හරහා ජනාධිපතිවරයෙකු නෙරපා හැරීමෙන් ලබාගත් සාමූහික විශ්වාසය අරගලය පිළිබඳ ආඛ්‍යානවල පැහැදිලිව දක්නට ලැබුණු දෙයක් විය.

## දෙවන අදියර:
## ක්‍රම වෙනස දේශපාලන වැඩසටහනක් ලෙස

රට පාලනය කිරීමට ප්‍රමාණවත් ඡන්ද ලබා ගැනීමට මින් පෙර කිසිදා සමත් නොවූ දේශපාලන පක්ෂයක් සහ සමාජ ව්‍යාපාරයක් වන ජාතික ජන බලවේගය කෙරෙහි අරගලයේ අභිලාෂයන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් ජනතා විශ්වාසය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමග අරගලයේ දෙවන අදියර ආරම්භ විය. මෙම අදියර නිහඬ අදියරක් ලෙස විස්තර කළ හැකි අතර, එහි කැපීපෙනෙන සිදුවීම් නොමැත. පළමු වෙනි අදියරේ පැවති ප්‍රතිරෝධය පිළිබඳ සවිඥානිකබව ක්‍රමයෙන් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි අලුත් වූ විශ්වාසයක්

තැබූ දේශපාලන සවිඥානිභාවයක් බවට පරිවර්තනය වන්නට විය. මෙම ක්‍රියාවලියට පහසුකම් සලසන ලද්දේ අරගලය තුළින් තුරන් කිරීමට උත්සාහ කරන ලද දූෂිත අවශේෂ ප්‍රතිමූර්තිමත් කළ වික්‍රමසිංහ සහ ඔහුගේ රජයේ අඛණ්ඩ පැවැත්ම විසින් ය.

මෙම රචනයේ හැඳින්වීමෙහි සඳහන් කළ පරිදි, ජනතා විමුක්ති පෙරමුණ විවිධ සමාජ පන්ති සහ කණ්ඩායම් ඒකරාශි කර ගැනීමට සමත් පක්ෂයක් සහ ව්‍යාපාරයක් බවට පරිණාමය වීම අතිශය වැදගත් හැරවුම් ලක්ෂ්‍යයක් බවට පත් වූයේ අරගලයට සහභාගී වූ පුරවැසියන්ට අරගලය අසම්පූර්ණයි යන හැඟීම කරදරකාරී වූ කාල පරිච්ඡේදයක් තුළ ය. එබැවින්, අරගලය විසින් පරිකල්පනය කරන ලද ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් දේශපාලන වැඩසටහනක් ඉදිරිපත් කරමින් ජනතාවගේ දේශපාලන සවිඥානිකභාවය පරිවර්තනය කිරීම සඳහා ජාතික ජන බලවේගය සිදු කළ මැදිහත්වීම ඒ සඳහාම යෝග්‍ය වූ මනා වතාවරණයක් තුළ සිදු විය.

මෙම මැදිහත්වීම සිදුවූ වාතාවරණය තුළ වැදගත් අවකාශයන් දෙකක් හඳුනාගත හැකියඃ "ක්‍රම වෙනස" සාපේක්ෂ වශයෙන් හිස් හැඟවුම්කාරකයක්ව පැවති දෘෂ්ටිවාදාත්මක අවකාශය ඉන් පළමුවැන්න වේ; ඡන්ද රැස්කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන දේශපාලන සංවිධානාමය ජාල අවකාශය දෙවැන්න වේ. මෙම අවකාශ දෙක අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර නොවන බව අමුතුවෙන් කිව යුතු නැත.

මතවාදය සැලකිල්ලට ගත් විට, සියලුම සාම්ප්‍රදායික ප්‍රභූ දේශපාලන පක්ෂ සහ පාලක පන්තිය දූෂිත, අසංවේදී සහ අදක්ෂ බව ජාතික ජන බලවේගය විසින් ප්‍රකාශ කරන ලද අතර, එය දශක ගණනාවක් පුරාවට ජනතා විමුක්ති පෙරමුණ විසින් ප්‍රචාරය කරන ලද විවේචනය සමග දැඩි ලෙස අනුනාද වූ අදහසක් විය. කෙසේ වෙතත්, ජාතික ජන බලවේගයේ මැතිවරණ ප්‍රකාශනයෙහි සහ කථාවල, එහි පෙර ව්‍යාපාරවල දක්නට ලැබුණු සමාජවාදී වාග් මාලාවන් විශේෂයෙන්

අත්හැර තිබුණි. උයන්ගොඩ විසින් නිරීක්ෂණය කරන ලද පරිදි, සමාජවාදී වාග්මාලාව පමණක් නොව, සම්මත දේශපාලන මතවාදාත්මක වාග් මාලාවන්හි අනෙකුත් ස්වරූප ද හිතාමතාම මග හැර තිබූ බවක් පෙනෙන්නට තිබුණි. ඒ වෙනුවට, එම භාෂාව කිසිදු නිශ්චිත දේශපාලන මතවාදාත්මක දිශාවකට පක්ෂපාතී බවක් සංඥා නොකර, බොහෝ දුරට මධ්‍යස්ථව පැවතුණි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලන තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී, සාම්ප්‍රදායික මතවාදාත්මක කාණ්ඩ යම් ආකාරයකට යල් පැන ගිය ඒවා බව ඔහු තවදුරටත් සඳහන් කරයි.[3] මෙවැනි මධ්‍යස්ථභාවයක් තිබියදීත්, මෙයට පෙර අරගලය පැවති යුගයේ පළමු වෙනි අදියරේ දී හිස් සංකේතකයක්ව තිබූ ක්‍රම වෙනස යන යෙදුම සඳහා ජාතික ජන බලවේගය සැලකිය යුතු මතවාදාත්මක අන්තර්ගතයක් ලබා දුන්නේය.

පශ්චාත්-අරගල සමයේ දී, ජාතික ජන බලවේගය ස්වකීය මැතිවරණ ව්‍යාපාරයේ කේන්ද්‍රීය ආදර්ශ පාඨය ලෙස 'නව පුනරුද යුගයක්' යන යෙදුම නිර්මාණය කළේය. 'පුනරුදය' කතිකාවට අනුව, ජාතික ජන බලවේගයේ මැතිවරණ ජයග්‍රහණයක් මගින් අධ්‍යාපනය, සෞඛ්‍යය, නිෂ්පාදන ආර්ථිකය, ප්‍රවාහනය, කලාව සහ සංස්කෘතිය ඇතුළුව සමාජයේ සෑම අංශයක් ම සමානාත්මතාවය, වගවීම සහ සාධාරණත්වය තහවුරු වන පරිදි ප්‍රතිසංස්කරණය කරමින් මෙම නව පුනරුදයට මග පාදනු ඇත. දේශපාලනඥයින් ඇතුළු සියලු දෙනා නීතියේ ආධිපත්‍යයට යටත් වනු ඇති බවත්, සියලු ආකාරයේ දූෂණයන් මුලිනුපුටා දමන බවත්, එමගින් ආර්ථික සමෘද්ධිය අත්කර ගත හැකි වන බවටත් මෙම ව්‍යාපාරය පොරොන්දු විය. මෙම මතවාදය ජාතික ජන බලවේගය රජයක් යටතේ සාක්ෂාත් කරගත හැකි දේශපාලන වැඩසටහනක් ලෙස ඉදිරිපත් කිරීම මගින් පක්ෂයට පුළුල් සහයෝගයක් ලබා ගැනීමට හැකි විය. කලින් සඳහන් කළ පරිදි, මෙම වැඩසටහනෙහි සමාජවාදයේ කිසිදු සලකුණක් නොතිබූ අතර,

3. 2024 නොවැම්බර් මස 09 වෙනි දින නීතිය හා සමාජ භාරයේ පැවති සාකච්ඡාවක දී ඔහු මෙම අදහස ප්‍රකාශ කළේය.

එය සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ලිහිල් අර්ථයකින් නියෝජනය කළේය. අනෙකුත් දේශපාලන පක්ෂ විසින් ජාතික ජන බලවේගය යනු ලේ තැවරුණු විප්ලවකාරී අතීතයක් සහ භයානක දේශපාලන අනාගතයක් සහිත අන්ත-මාක්ස්වාදී කණ්ඩායමක් ලෙස හඳුන්වා දෙන ලද ප්‍රතිවිරුද්ධ ආඛ්‍යාන තිබුණද, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිවල කිසිදු අන්ත වාමාංශික පරමාදර්ශයක් තිබෙන බවක් නොදුටු නිසා ජනතාව ඔවුන්ට ඡන්දය දුන් බව පිළිගත හැකිය.

එයට අමතරව, දේශපාලන පක්ෂයක් මෙන්ම ජනතා ව්‍යාපාරයක් ද ලෙස ජාතික ජන බලවේගය බහුවිධ අංශ හරහා ක්‍රියාත්මක වූයේය. දේශපාලන පක්ෂයක් ලෙස එය ගම් මට්ටම දක්වා විහිදී ගිය කමිටු ජාලයක් ස්ථාපනය කර තිබුණි. රැස්වීම් සහ ප්‍රචාරක ව්‍යාපාර සංවිධානය කිරීමේදී ජනතා විමුක්ති පෙරමුණේ සාමාජික ජාල සතු වූ කාර්යක්ෂමතාවය සැලකිය යුතු සාධකයක් විය. විවිධ ක්ෂේත්‍රවල ඒ වන විටත් ක්‍රියාකාරීව සිටි ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් ඇතුළත් කරමින් නව ජාතික ජන බලවේගයේ ව්‍යුහයන් සකස් කරන ලදී. පක්ෂ යාන්ත්‍රණයන් විසින් ජනතාව සංවිධානය කරන ලද අතර, කාන්තාවන්, තරුණයින්, කලාකරුවන් සහ විශ්වවිද්‍යාල ශාස්ත්‍රඥයින් සඳහා වූ අංශ වැනි ව්‍යාපාරයේ විවිධ අංශ එය දියුණු කිරීමට දායක විය.

කෙසේ වෙතත්, ජනාධිපතිවරණයට පෙර පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවලට අනුව, ගම් මට්ටමේ ජාතික ජන බලවේග ජාල කාර්යක්ෂමව ජනතාව වෙත ළඟා වී නොතිබුණි. මැතිවරණ ව්‍යාපාරය අතරතුර අනෙකුත් දේශපාලන පක්ෂ අඩු ක්‍රියාකාරී බවක් පෙන්වූ බව පිළිගන්නා අතර ම, ජාතික ජන බලවේගය ජනතාව සමග වඩාත් වැඩියෙන් සම්බන්ධ විය යුතු යැයි සේරුවිල, මාතලේ සහ සූරියවැව යන ප්‍රදේශවල ප්‍රතිචාර දැක්වූවන් බොහෝ විට පැමිණිලි කළෝය. ජාතික ජන බලවේගයට සහාය දීමට කැමත්තෙන් සිටින නමුත් පක්ෂය සමග සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට ප්‍රවේශයක් නොමැති

පුද්ගලයින් සිටින බව මෙම ප්‍රදේශවල, ප්‍රතිචාර දැක්වූවන් පැහැදිලිවම පෙන්වා දුන්නේ යි. මෙවැනි කළකිරීම් සහගත හැඟීමක් තිබියදීත්, බොහෝ දෙනෙක් තමන් ජාතික ජන බලවේගයට ඡන්දය දෙන බවත් එය ජයග්‍රහණය කරනු ඇතැයි අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කළහ. ඔවුන් තුළ ඇති මෙම කලකිරීම් සහගත හැඟීම ව්‍යාපාරයේ කොටසක් වීමට ඔවුන් තුළ ඇති කැමැත්ත පෙන්නුම් කරන සාක්ෂියකි.

මෙම පුද්ගලයින්ගෙන් බොහෝ දෙනෙක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ ගෝඨාභය රාජපක්ෂ වෙනුවෙන් පෙර පැවති දේශපාලන ව්‍යාපාරවල ක්‍රියාකාරීව සිටියා පමණක් නොව, මැතිවරණ දේශපාලනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පිහිටුවා තිබූ අනුග්‍රාහක ජාල තුළ ද ස්ථාවර වී සිටියහ.

මෙහි දී සාම්ප්‍රදායික ප්‍රභූ දේශපාලන පක්ෂ කාලයත් සමග ඔවුන් විසින් ගොඩනගා ගෙන ශක්තිමත් කර තිබූ අනුග්‍රාහක ජාල හරහා පුරවැසියන් ඒකරාශි කර ගන්නා ලද ආකාරය අවබෝධ කර ගැනීම වැදගත් වේ. ශ්‍රී ලාංකාවේ ඡන්දදායකයින් සහ දේශපාලන පක්ෂ අතර සම්බන්ධතාවය පිළිබඳව පුළුල් ලෙස පර්යේෂණ කර ඇති පීරිස් (2024) මෙසේ පවසයි:

> *දේශපාලන පක්ෂ පිළිබඳ මෑත කාලීනව රචනා කර ඇති ලියවිලි මගින් එම පක්ෂ අවමංගල්‍ය සමිති, ණය කණ්ඩායම්, ආගමික සංවිධාන, අවිධිමත් කුල සහ පවුල් ජාල හරහා පමණක් නොව නීති විරෝධී/අපරාධ ක්‍රියාකාරකම් සඳහා සහාය වන ජාල ඇතුළු සංකීර්ණ සමාජ සම්බන්ධතා ජාලයක් හරහා ඡන්දදායකයින් සමග සම්බන්ධ වන බව අවධාරණය කරයි.*

එක් එක් දේශපාලන පක්ෂයේ විවිධ මට්ටම්වල නායකයින් අනුග්‍රාහක ප්‍රතිලාභ ලබා දීම සඳහා සහ ඡන්දදායකයින් සංවිධානය කිරීම සඳහා ගම්වල මෙම ජාල තුළ සිටින ප්‍රධාන ක්‍රියාකාරීන් යොදා ගන්නා ආකාරයත්, මෙම අතරමැදියන් පක්ෂයේ/දේශපාලනඥයාගේ සහ

ඡන්දදායකයින්ගේ අවශ්‍යතා සපුරාලීමේදී වැදගත් කාර්යයක් ඉටුකරන නියෝජිතයන් බවට පත්වන ආකාරයත් ඔහු තවදුරටත් පැහැදිලි කරයි (එම). ජනාධිපතිවරණයේ දී සුළු වැඩි ඡන්ද ප්‍රතිශතයකින් ජාතික ජන බලවේගය ලබාගත් ජයග්‍රහණයෙන් පසුව, එම විශ්ලේෂණය මත විශ්වාසය තබමින් පීරිස් අනුමාන කළේ, ජාතික මට්ටමේ ප්‍රචාරණය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ ජනාධිපතිවරණයේ දී මෙන් නොව, පාර්ලිමේන්තු මැතිවරණයේ දී ජාතික ජන බලවේගයට තනිවම රජයක් පිහිටුවීමට ප්‍රමාණවත් ඡන්ද ලබා ගැනීමට වෙහෙස දැරීමට සිදු වනු ඇති බවය. මෙය ස්ථාපනය වී තිබූ පක්ෂ ආරක්ෂා කරන සාම්ප්‍රදායික අනුග්‍රාහක ජාලවල බලපෑම විශ්වාස කරමින් ප්‍රකාශ කරන ලද්දකි. කෙසේ වෙතත්, අපි දැන් දන්නා පරිදි, මහ මැතිවරණයේ ප්‍රතිඵලය පීරිස් වැනි දේශපාලන විශ්ලේෂකයින් පමණක් නොව, ජාතික ජන බලවේගයේ ම අනුගාමිකයින් ද මවිතයට පත් කළේය. මින් පෙර කිසි දිනෙක සිංහල-බෞද්ධ බහුතරය සහිත පක්ෂයකට ඡන්දය නොදුන් ප්‍රදේශ වන උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වලින් ලැබුණු සහයෝගය ඇතුළුව දිවයින පුරා ජනතාවගෙන් පෙර නොවූ විරූ පරිදි ලැබුණු ඡන්දයෙන් හෙළිදරව් වූයේ මෙම මැතිවරණයේ දී සාම්ප්‍රදායික ප්‍රභූ දේශපාලන පක්ෂ ආරක්ෂා කරන මැතිවරණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක වීම නතර වී ඇති බව ය.

අප පවත්වන ලද සම්මුඛ සාකච්ඡා නැවත අධ්‍යයනය කර බැලීමෙන් අරගලය පැවති සමයේ දී අනුග්‍රාහක ජාල බිඳවැටීම පිළිබඳ අතිශය වැදගත් අවබෝධයක් ලබා ගත හැකි ය. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ අනුග්‍රාහක ජාලයට දැඩි ලෙස සමීපව සිටි අයෙක් ප්‍රතිචාර දක්වන්නෙකු ලෙස සූරියවැව ප්‍රදේශයේ දී අප හා සම්බන්ධ විය. 2019 දී පක්ෂයේ මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව ඔහුට ඉතා ලාභදායී ව්‍යාපාරයක් වූ වැලි කැණීම සඳහා බලපත්‍රයක් ලබා දෙන ලදී; මෙය අනුග්‍රාහක-සේවාදයක රාමුව තුළ දේශපාලන පක්ෂපාතීත්වයට ප්‍රතිලාභ ලැබුණු ආකාරය පිළිබඳ ඉතා වැදගත් උදාහරණයකි. අරගලයේ මුල් අවධියේ දී, මෙම ප්‍රතිචාර දැක්වූ පුද්ගලයා සදාචාරාත්මක හා

දේශපාලනික උභතෝකෝටිකයකට මුහුණ දුන්නේ ය. එක් අතකින්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමග ඔහුට තිබූ සම්බන්ධතාවය නිසා එයට පක්ෂපාතී වීමට ඔහුට බලකෙරුණි; අනෙක් අතට, උග්‍රවෙමින් පැවති පොහොර අර්බුදය සහ වඩාත් නරක අතට හැරෙමින් තිබූ ආර්ථික අස්ථාවරත්වය ඔහුගේ ජීවනෝපායට සහ ප්‍රජාවට සෘජුව ම බලපෑවේය. ඔහුගේ ප්‍රදේශය තුළ අරගලයට දැඩි ආකර්ෂණයක් ලැබීමත්, විරෝධතා ව්‍යාපාරය සමග වැඩි පිරිසක් පෙළගැසීමත් සමග ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාලනය කෙරෙහි ඔහු තුළ තිබූ කලකිරීම වර්ධනය විය. එසේ වුවත්, ඔහු මුලදී අරගලයට විවෘතව සහභාගී වීමෙන් වැළකී සිටි අතර, එමගින් කලක් ඔහුට ප්‍රතිලාභ ලබා දුන් පද්ධතිය සමග තිබූ සම්බන්ධතා බිඳ දැමීම පිළිබඳව ඔහු තුළ තිබූ චකිතය පිළිබිඹු කරයි.

මැයි 9 වන දින ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සම්බන්ධ මැරයන් විසින් ගාලු මුවදොර දී එල්ල කරන ලද ප්‍රහාරය මගින් හැරවුම් ලක්ෂ්‍යයක් නිර්මාණය කළේය. ක්ෂණික ආත්මීයකරණය තීව්‍ර වූ මොහොතක, ප්‍රහාරය දියත් කර ආපසු එමින් සිටි අයට මුහුණ දී ඔවුන්ට පහර දීම සඳහා ඔහු අධිවේගී මාර්ග පිවිසුමක් අසල සිටි තවත් සමූහයක් සමග එක් විය. මෙම ක්‍රියාව ඔහුගේ දේශපාලන හැසිරීම් වල සැලකිය යුතු පිපිරීමක් සනිටුහන් කළේය. ඔහුගේ ව්‍යාපාරය ද තවත් බොහෝ ව්‍යාපර මෙන් ආර්ථික අර්බුදයේ බලපෑමට ලක්වී තිබුණු නිසා ඔහුගේ තීරණය ප්‍රායෝගික සැලකිලිමත්වීම් මත පදනම් වූවක් යැයි ඇතමුන්ට තර්ක කළ හැකි වුවද ඔහුගේ ක්‍රියාවන් ආත්මාර්ථකාමීත්වය අභිබවා ගිය බව පැහැදිලිය. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ සමග පෙළගැසී සිටි පුද්ගලයින්ට පහර දීම සහ පක්ෂයේ යාන්ත්‍රණයන්ගෙන් ඈත් වීම කලක් ඔහු යැපුන අනුග්‍රාහක ක්‍රමය නිර්භීතව සහ ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කිරීම සංකේතවත් කළේය.

මෙම මාරුවීම, වඩාත් ගැඹුරු සහ වඩාත් දියුණු ආකාරයක දේශපාලන ආත්මීය බවක් ඉස්මතු කර පෙන්වයි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආධාරකරුවන්ට එරෙහිව සෘජු, ගැටුම්කාරී ක්‍රියාමාර්ගයකට

සහභාගී වීමට ඔහු දැක්වූ කැමැත්ත මගින් ඔහු තුළ තිබූ ආර්ථිකමය කලකිරීමට වඩා වැඩි යමක් අදහස් කරයි. එය අරගලයෙහි මූලධර්ම සහ ගම්‍යතාවය සමග ඇති පෙළගැස්මෙහි වර්ධනය වීමක් පිළිබිඹු කරයි. පෞද්ගලික කලකිරීමෙහි සිට සාමූහික ප්‍රතිරෝධයට සක්‍රියව සහභාගීවීම දක්වා වූ මෙම වර්ධනයවීම අරගල ව්‍යාපාරයට තිබූ පරිවර්තනීය බලය අවධාරණය කරයි. ඔහුගේ ආඛ්‍යානය මගින් අර්බුදකාරී අවස්ථාවන්හි දී අනුග්‍රාහක-සේවාදායක ජාල බිඳවැටීම දේශපාලන ආත්මීයත්වය නැවත සකස්වීමට හේතු විය හැකි ආකාරයත්, ස්වයං-ප්‍රතිලාභ ඉක්මවා පද්ධති වෙනසක් සමග වඩාත් පුළුල් අනන්‍යවීමක් වෙත පුද්ගලයින්ව රැගෙන යන ආකාරයත් පෙන්නුම් කරයි.

රජයේ දේශපාලනඥයන්ගේ පෞද්ගලික දේපළ ගිනි තැබූ මැයි 9 වෙනි දින සිදුවූ සිදුවීම්, මෙම බැඳීම්වල අතිශය වැදගත් හා සංකේතාත්මක බිඳවැටීමක් සනිටුහන් කළේය. මෙම බැඳීම් බිඳීයන විට, අනුග්‍රාහක-සේවාදායක ජාල තුළ සිටි ප්‍රධාන ක්‍රියාකාරීන්ට තමන් දේශපාලනිකව ආන්තිකවන බව වැටහී ගියේය. අරගලයේ දෙවන අදියරේ දී, ජාතික ජන බලවේගය මෙම වියවුල් සහගත තත්ත්වයෙන් ප්‍රයෝජන ගෙන, මෙම ක්‍රියාකාරීන් ඔවුන්ගේ පරිවර්තනීය දේශපාලන න්‍යාය පත්‍රය වෙත ඒකරාශි කර ගත්තේ ය. පක්ෂපාතීත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබාදීමේ පොරොන්දු මත විශ්වාසය තැබූ සාම්ප්‍රදායික පක්ෂ මෙන් නොව, ජාතික ජන බලවේගය මූලික වශයෙන්ම වෙනස් දේශපාලන සහභාගීත්ව ආකෘතියක් ඉදිරිපත් කළේය. මෙයට අනුග්‍රාහක-සේවාදායක රාමුව තුළ ක්‍රියාත්මක වූ ක්‍රියාකාරීන් සැලකිය යුතු සංඛ්‍යාවක් ස්වකීය දේශපාලන යාන්ත්‍රණයට ඇතුළත් කර ගැනීමට එය සමත් විය. තමන්ට මෙයට පෙර ලැබුණු වරප්‍රසාද ඉවත දැමූ මෙම පුද්ගලයින් සක්‍රීය ලෙස ජාතික ජන බලවේගය හා සම්බන්ධ වූහ; ඔවුන් එසේ කළේ ක්ෂණික අනුග්‍රහයන් ලැබීමේ අපේක්ෂාවෙන් නොව, ක්‍රම වෙනස පිළිබඳ එම පක්ෂයේ පුළුල් දැක්ම සමඟ පෙළගැසීමේ අවශ්‍යතාවය හේතුවෙනි.

අනුග්‍රාහක ජාල බාදනය වීම පුරවැසියන්ගේ මැතිවරණ පිළිවෙත්වල අතිශය වැදගත් පරිවර්තනයක් සනිටුහන් කළ අතර එය මැතිවරණ දේශපාලනය තුළ ඔවුන්ගේ හුරුපුරුද්දෙහි ප්‍රබල වෙනසක් ඇති වූ බව පෙන්නුම් කළේය. මෙම වෙනස පුරවැසියන් ඓතිහාසිකවම සාම්ප්‍රදායික දේශපාලන ප්‍රභූන්ගේ ආධිපත්‍යයට නතු වී සිටි, අභ්‍යන්තරීකරණය කරන ලද ආකල්ප සහ පිළිවෙත් නැවත සකස්කර ගැනීමක් ලෙස අවබෝධ කර ගත හැකි ය. දශක ගණනාවක් තිස්සේ මෙම ප්‍රභූන්ට මැතිවරණමය වශයෙන් යටත්වී සිටීම ඓතිහාසික ක්‍රියාවලීන් හරහා පරිණාමය වූ, ගැඹුරින් කාවැදී ඇති බල ව්‍යුහයන් මඟින් හැඩගැසී තිබූ අතර, එවැනි රටා ස්වාභාවික හා නොවැළැක්විය හැකි බව පෙනෙන්නට තිබුණි.

පාලක ප්‍රභූන්ගේ දූෂණය පිළිබඳ මතවාදාත්මක මැදිහත්වීම් සහ දේශපාලන දැනුම ව්‍යාප්ත කිරීම පුළුල්ව පැතිර තිබුණු අතර, මෙම බල ව්‍යුහයන් චක්‍රීය ලෙස ප්‍රතිනිෂ්පාදනයවීම බිඳ දැමීමට ඒවා ප්‍රමාණවත් නොවන බව ඉතිහාසය තුල තහවුරු විය. සාමූහික දේශපාලන ක්‍රියාකාරීත්වයක් නොමැතිව දේශපාලන දැනුවත්භාවයට පමණක් ප්‍රභූන්ගේ පාලනය පවත්වා ගෙන යන සංකේතාත්මක ආධිපත්‍යයෙහි යාන්ත්‍රණයන් බිඳදැමීමට නොහැකි වන බව මෙයින් පෙන්නුම් කරයි. අරගලය තුළ ශක්තිමත් වූ නව දේශපාලන ආත්මීයත්වයක් මතුවීම හරහා පමණක් මෙම බිඳවැටීම සිදු කළ හැකි විය. සාමූහික ක්‍රියාකාරීත්වය තුළ මුල් බැසගත් ඉහළ දේශපාලන සවිඥානිකභාවයක් වර්ධනය කිරීම මඟින් අරගලය විසින් යටත් වීමේ අභ්‍යන්තර ව්‍යුහයන්ට අභියෝග කරමින් දේශපාලන නියෝජිතත්වය නැවත පරිකල්පනය කිරීමට පහසුකම් සැලසූ අතර, එය පාලක ප්‍රභූන්ගේ අඛණ්ඩ මැතිවරණ ජයග්‍රහණ තහවුරු කරමින් මුල් බැසගෙන තිබූ චක්‍රය බිඳ දැමුවේය.

ජනතා ව්‍යාපාරයක් ලෙස ජාතික ජන බලවේගයට ස්වකීය විෂය පථය තුළට ජනතාවගේ සාමූහික ගතිකත්වය ඇතුලත් කර ගැනීමට හැකි වූ අතර, එය අරගලයේ පළමු වෙනි අදියර තුළ දී හැඩගැසුණු

දේශපාලන ආත්මීයත්වය ශක්තිමත් කළේය. වික්‍රමසිංහ සහ ඔහුගේ රජය අරගලයේ බලපෑම් ආපසු හැරවීමට උත්සාහ කළද, ව්‍යාපාරයක් ලෙස ජාතික ජන බලවේගය එහි ධනාත්මක බලපෑම් ආරක්ෂා කර ගැනීමට පමණක් නොව වැඩි දියුණු කර ගැනීමට ද සමත් විය. බිඳී ගිය ජාල අරගලයේ පළමු වෙනි අදියරේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදී සාමූහික පිළිවෙත්වල ඍජු ප්‍රතිඵලයක් වූ අතර, දෙවන අදියරේ දී මෙම රික්තය තුළ නව දේශපාලන සම්බන්ධතා ගොඩනගා ගැනීමට මැදිහත් වීම මගින් ජාතික ජන බලවේගයට පරිවර්තනීය මැතිවරණ දේශපාලනයක නියැළීම සිදු කළ හැකි විය. මෙම අදියර ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය යන දෙකෙහිදී ම ජාතික ජන බලවේගය ජයග්‍රහණය කිරීමෙන් අවසන් විය.

## තෙවන අදියර:

## ක්‍රම වෙනස සැබෑ කරගැනීම

ක්‍රම වෙනසක් කරා සැබවින් ම ගමන් කිරීමට නම්, අරගලය විසින් ආරම්භ කරන ලද පරිවර්තනය දේශපාලන සවිඥානිකභාවයෙන් ඔබ්බට ගොස් ආණ්ඩුකරණයේ ව්‍යුහාත්මක මානයන් දක්වා විහිදී යා යුතු ය. මේ සඳහා රාජ්‍ය පාලනය ක්‍රියාත්මක කරනු ලබන ආයතන, යාන්ත්‍රණ, ප්‍රතිපත්ති සහ පිළිවෙත් නැවත පරිකල්පනය කිරීම අවශ්‍ය වේ. එවැනි ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා ඉතා යෝග්‍ය පරිසරයක් අරගලය විසින් නිර්මාණය කර ඇති අතර, ජාතික ජන බලවේග රජයක් යටතේ පුරවැසි සහභාගීත්වය අගය කරන සහ දිරිමත් කරන නව පාලන ආකෘතියක් සකස් කිරීමේ විභවයක් ඇත. මෙම දැක්ම ප්‍රධාන මට්ටම් තුනකින් සාක්ෂාත් කරගත හැකියඃ

### 1. පුරවැසියන් ගම් මට්ටමේ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට ඇතුළත් කර ගැනීම

ගම් මට්ටමේ පාලනයට සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික පදනමක් බවට පත්වීමේ විභවය ඇත. සම්පත් වෙන් කර දීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ පොදු සේවා සැපයීම වැනි ප්‍රාදේශීය මට්ටමේ

ගැටළු සාකච්ඡා කිරීම සඳහා වන ගම් මට්ටමේ සහභාගීත්ව කමිටු පිහිටුවීම හරහා මෙය සාක්ෂාත් කරගත හැකිය. ගම් මට්ටමේ අයවැය සැකසීම පුරවැසියන්ට ප්‍රාදේශීය අරමුදල් වෙන් කරන ආකාරය පිළිබඳව අදහස් දැක්විය හැකි වන පරිදි විනිවිදභාවයෙන් යුතුව හා සහභාගීත්වය තුළින් සිදු කරන බව සහතික කළ යුතුය. නිරන්තර සමාලෝචන, ප්‍රතිපෝෂණ සැසි සහ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණ හරහා ගමෙහි ජනගහනය විසින් ප්‍රාදේශීය නියෝජිතයින් වගකිව යුත්තන් බවට පත් කළ හැකි වේදිකා නිර්මාණය කළ යුතුය. කාන්තාවන්, තරුණයින් සහ සුළුතර කණ්ඩායම් වැනි ආන්තික කණ්ඩායම් තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට ඇතුළත් කරගැනීමට ප්‍රමුඛත්වය දීම මගින් ඔවුන්ගේ දෘෂ්ටිකෝණයන් සහ අවශ්‍යතා නියෝජනය වන බව සහතික කළ යුතුය.

මෙම ප්‍රවේශය මගින් බලය විමධ්‍යගත කරනවා පමණක් නොව, බිම් මට්ටමේ දී ම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ඇතුළත් කරමින් පුරවැසියන් අතර අයිතිය සහ වගකීම පිළිබඳ හැඟීමක් ද ඇති කරයි.

## 2. රජයේ ආයතනවල තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට නිලධාරීන් ඇතුළත් කර ගැනීම

රජයේ ආයතන බොහෝ විට අධික ලෙස ධූරාවලිගතවී තිබීම සහ වෙනස් වීමට ප්‍රතිරෝධය දැක්වීම සම්බන්ධයෙන් විවේචනයට ලක් වෙයි. මෙම මට්ටමේ දී රාජ්‍ය පාලනයේ පරිවර්තනයක් ඇති කිරීමට පහත සඳහන් දෑ ඇතුළත් වෙයි: විවිධ විශේෂඥතාවයන් සහ බිම් මට්ටමේ දැනුම ප්‍රතිපත්තිවලට ඇතුළත් කර ගනු ලබන බව සහතික කිරීම සඳහා විවිධ මට්ටම්වල නිලධාරීන්ට තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට දායක විය හැකි වේදිකා රාජ්‍ය ආයතන තුළ නිර්මාණය කිරීම; විනිවිදභාවය, වගවීම සහ ප්‍රතිචාරදක්වීම අවධාරණය කරමින් සහභාගීත්ව පාලනයෙහි නියැළීම සඳහා නිලධාරීන් තුළ අවශ්‍ය කුසලතා ඇති කිරීම; විවිධ මට්ටම්වල නිලධාරීන් සවිබල ගැන්වීම මගින් අධික ලෙස මධ්‍යගතවීම අඩු කිරීම.

## 3. ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන්ට සිවිල් සමාජ සංවිධානවල හඬ ඇතුළත් කර ගැනීම

සිවිල් සමාජ සංවිධාන විවිධ අයිතීන් නියෝජනය කරමින් සහ සමාජ අවශ්‍යතා පිළිබඳ අතිශය වැදගත් අවබෝධයන් සපයා දෙමින් බොහෝ විට රජය සහ මහජනතාව අතර සම්බන්ධකය ලෙස ක්‍රියා කරයි. ප්‍රතිපත්ති සම්පාදනයේ දී එම සංවිධාන ඇතුළත් කර ගැනීම පහත සඳහන් ක්‍රියාමාර්ග හරහා සාක්ෂාත් කරගත හැකි යඃ අධ්‍යාපනය, සෞඛ්‍යය, පරිසරය සහ සමාජ සාධාරණත්වය වැනි අදාළ ප්‍රතිපත්ති ක්ෂේත්‍ර පිළිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා විවිධ සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයින්ගෙන් සමන්විත උපදේශක සභා පිහිටුවීම; ප්‍රධාන ප්‍රතිපත්ති සකස් කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට පෙර ප්‍රජාවන්ගේ ආදානයන් ලබා ගැනීම සඳහා සිවිල් සමාජ සංවිධාන විසින් පහසුකම් සපයනු ලබන මහජන උපදේශන පැවැත්වීම; ප්‍රතිපත්ති විසඳුම් නව්‍ය සහ යථාර්ථය පදනම් කරගත් ඒවා බව සහතික කිරීම සඳහා ජනවාර්ගික ප්‍රශ්නය, ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාවය හෝ මලයහ දෙමළ ප්‍රජාවගේ සුබසාධනය වැනි නිශ්චිත ගැටළු කෙරෙහි අවධානය යොමු කරන සිවිල් සමාජ සංවිධාන සමග ක්‍රියාකාරී කණ්ඩායම් නිර්මාණය කිරීම; රජයේ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කරනු ලබන බව සහ ඕවායෙහි අපේක්ෂිත අරමුණු සපුරාලන බව සහතික කිරීම සඳහා ඒවා නිරීක්ෂණය කිරීම සහ ඇගයීම පිණිස සිවිල් සමාජ සංවිධාන සම්බන්ධ කර ගැනීම.

මෙම සහයෝගීතාවය රජය සහ ජනතාව අතර ඇති පරතරය පියවීමට, විශ්වාසය වැඩිදියුණු කිරීමට සහ ප්‍රතිපත්ති මගින් සමාජයේ අවශ්‍යතා සහ අභිලාෂයන් පිළිබිඹු කරන බව සහතික කිරීමට උපකාරී වෙයි.

අරගලය විසින් දැනටමත් දේශපාලන සවිඥාණිකභාවය නැවත හැඩගස්වා ඇත, එහෙත් පද්ධති වෙනසක් සඳහා මෙවැනි සහභාගීත්ව මූලධර්ම පාලනයේ ව්‍යුහයට අන්තර්ගත කර ගත යුතු වේ. විවිධ මට්ටම්වල තීරණ ගැනීම සඳහා පුරවැසියන්, නිලධාරීන් සහ සිවිල්

සමාජ සංවිධාන ඒකාබද්ධ කිරීම මගින් ජාතික ජන බලවේග රජයට අරගලයේ අභිලාෂයන් පිළිබිඹු කරන පමණක් නොව, තිරසාර, අන්තර්කරණය වූ සහ ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයක් සඳහා අඩිතාලම ද දමන පාලන ආකෘතියක් නිර්මාණය කළ හැකි ය.

## සමාප්තිය

අරගලය ජූලි 9 වෙනි දින සිදු වූ අපූර්ව සිදුවීමෙන් අවසන් නොවූ බවත්, එහෙත් එහි උපක්‍රම පරිවර්තනය කර ගනිමින්, විවිධ අවධීන්වලට නව ක්‍රියාකාරීන් ඇතුළත් කර ගනිමින් ගතිකව පරිණාමය වූ බවත් මෙම පත්‍රිකාව මගින් තර්ක කර ඇත. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද සහ බිම් මට්ටමේ ඒකරාශි කර ගැනීම්වලින් සංලක්ෂිත වූ ආරම්භක අදියර දෙවන අදියරකට මග පෑදූ අතර, එහිදී අරගලයේ අභිලාෂයන් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් හරහා යොමු කරන ලදී. මෙම මාරුවීම ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් සනිටුහන් කළ අතර, එය ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය යන දෙකෙහි දී ම ජාතික ජන බලවේගයට පෙර නොවූ විරූ ජයග්‍රහණ අත්කර දෙමින් අවසන් විය. මෙම ජයග්‍රහණ දෙවන අදියරේ අවසානය පමණක් නොව, රටේ දේශපාලන භූ දර්ශනය තුළ පද්ධතික පරිවර්තනයක් සඳහා ඇති විභවය ද සංකේතවත් කළේය.

කෙසේ වෙතත්, අරගලයේ අපේක්ෂාවන් ඉටු කර ගැනීම සඳහා වන ගමන නිම වීමට තවත් බොහෝ දුර තිබෙන බව මෙම පත්‍රිකාව තර්ක කරයි. ව්‍යාපාරයේ පළමු වෙනි සහ දෙවෙනි අදියර වලදී අපේක්ෂා කරන ලද පද්ධතිමය වෙනස්කම් සඳහා සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම අත්හදා බලනු ඊළඟ අදියරක් ද අවශ්‍ය වේ. මෙම පරිකල්පනය කර ඇති තුන්වන අදියරේ දී, රාජ්‍ය පාලනය මගින් හුදෙක් සාම්ප්‍රදායික ධූරාවලි ආකෘති ප්‍රතිනිර්මාණය කිරීමක් නොව, සියලු මට්ටම්වල තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි දී පුරවැසියන්, නිලධාරීන් සහ සිවිල් සමාජය සක්‍රීය ලෙස සම්බන්ධ කරගැනීම සිදුකරනු ඇත. මෙම මාරුවීමට සහභාගීත්ව පිළිවෙත් ආයතනිකකරණය කිරීම, බිම්

මට්ටමේ නියෝජනය සහතික කිරීම සහ සමානාත්මතාවය, වගවීම සහ සාධාරණත්වය යන මූලධර්ම නියෝජනය කරන සහයෝගී ප්‍රතිපත්ති සම්පාදන රාමු වැඩිදියුණු කිරීම ඇතුළත් වේ.

මේ අනුව, අරගලය විසින් ප්‍රතිරෝධය දැක්වීමේ මොහොතක් පමණක් නොව, ශ්‍රී ලංකාවේ දේශපාලන සවිඥානිකභාවය සහ එහි පාලන ව්‍යුහයන් නැවත අර්ථ දැක්වීම අඛණ්ඩව සිදු කරන පරිවර්තනීය ක්‍රියාවලියක් නියෝජනය කරයි.

## ආශ්‍රිත ලේඛන

ගියුග්නි, මාර්කෝ, ඩග් මැක්ඇඩම්, සහ චාල්ස් ටිලී, සංස්. *සමාජ ව්‍යාපාර වැදගත් වන ආකාරය*. මිනියාපොලිස්: මිනසෝටා විශ්ව විද්‍යාල මුද්‍රණාලය, 1999.

ගැම්සන්, විලියම් ඒ., *සමාජ විරෝධතා උපාය මාර්ගය*. 2 වන සංස්කරණය. බෙල්මොන්ට්, කැලිෆෝනියා: වොඩ්ස්වර්ත් ප්‍රකාශන, 1990.

බෝර්ඩියු, පියරේ. *ප්‍රායෝගික න්‍යායක දළ සටහන*. රිචඩ් නයිස් විසින් පරිවර්තනය කරන ලදී. කේම්බ්‍රිජ්: කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 1977.

පීරිස්, ප්‍රදීප්. *ශ්‍රී ලංකාවේ විවිධ වර්ගවල පක්ෂ සහ පක්ෂ-ඡන්දදායක සම්බන්ධතාවය*. පැල්ග්‍රේව් මැක්මිලන්, 2022

පීරිස්, ප්‍රදීප්. *"පාර්ලිමේන්තු මැතිවරණයේදී ජාතික ජන බලවේගයට එහි ජනාධිපතිවරණ ජයග්‍රහණය තහවුරු කර ගත හැකිද?" පොලිටි,* 2024 නොවැම්බර් 12.
https://polity.lk/can-the-national-peoples-power-consolidate-its-presidential-victory-in-the-parliamentary-election-pradeep-peiris/

අරගලය ජූලි 9 වෙනි දින සිදු වූ අපූර්ව සිදුවීමෙන් අවසන් නොවූ බවත්, එහෙත් එහි උපක්‍රම පරිවර්තනය කර ගනිමින්, විවිධ අවධීන්වලට නව ක්‍රියාකාරීන් ඇතුළත් කර ගනිමින් ගතිකව පරිණාමය වූ බවත් මෙම පත්‍රිකාව මගින් තර්ක කර ඇත. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද සහ බිම් මට්ටමේ ඒකරාශි කර ගැනීම්වලින් සංලක්ෂිත වූ ආරම්භක අදියර දෙවන අදියරකට මග පෑදූ අතර, එහිදී අරගලයේ අභිලාෂයන් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් හරහා යොමු කරන ලදී. මෙම මාරුවීම ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් සනිටුහන් කළ අතර, එය ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය යන දෙකෙහි දී ම ජාතික ජන බලවේගයට පෙර නොවූ විරූ ජයග්‍රහණ අත්කර දෙමින් අවසන් විය. මෙම ජයග්‍රහණ දෙවන අදියරේ අවසානය පමණක් නොව, රටේ දේශපාලන භූ දර්ශනය තුළ පද්ධතික පරිවර්තනයක් සඳහා ඇති විභවය ද සංකේතවත් කළේය.

ප්‍රකාශනය

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

**නීතිය හා සමාජ භාරය**
102/3, බාර්න්ස් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුරකතන : +94 11 2691228
+94 11 2684845
+94 11 2684853
ෆැක්ස් : +94 11 2686843
විද්‍යුත් තැපැල : info@lstlanka.org
වෙබ්අඩවිය : www.lstlanka.org

ISBN 978-624-5545-33-9
9 786245 545339